


## මුරලි 700 පසු කරයි

### ෂේන් වෝන්ගේ වාර්තාව බිඳින්නට අත ළඟයි



14 වන දින අස්ගිරියේ දී නිමාවට පත්වූ ශ්‍රී ලංකා බංග්ලාදෙශ් තෙවන ටෙස්ට් තරගයේදී කඩුලු 12ක් දවාගත් සුපිරි දඟපන්දුයවන්නා මුත්තයියා මුරලිදරන් සිය ගමනේ 700 වන කඩුල්ලද දවා ගත්තේ ය. මේ අනුව මුරලි කඩුලු දවාගැනීම පිළිබඳ ලෝක වාර්තාවට හිමිකම් කියන ශේන් වෝන්ට වඩා පිටුපසින් සිටිනුයේ කඩුලු 8 කින් පමණකි.



මුරලි 700 වැනි කඩුල්ල දවා ගැනීමෙන් අනතුරුව

මෙය මුරලි එක ඉනිමකදී කඩුලු 5 බැගින් දවාගත් 60 වන අවස්ථාව වන අතර හක් තරගයකදී කඩුලු 10ක් දවාගත් 20වන අවස්ථාව ද වෙයි.

මේ අනුව එළැඹෙන ඔස්ට්‍රේලියා සංචා රයේදී මුරලි ෂේන් වෝන් ගේ කඩුලු දවාගැනීමේ වාර්තාව බිඳ හෙළන්නට බොහෝ දුරට ඉට ඇත.

## සංගාගෙන් පිට පිට ද්විත්ව ශතක දෙකක්

බග්ලාදේශය සමග පැවැත්වූ දෙවන හා තෙවන ටෙස්ට් තරග දෙකේදී ම පිට පිටම ද්විත්ව ශතක දෙකක් ලබා ගත් කුමාර් සංගක්කාර ඒ දස්කම දැක්වූ ලොව හය වැනි ක්‍රීඩකයා බවට පත් විය.



ඩොන් බ්‍රැඩ්මන් වොල්ටර් හැමන්ඩ් විනොද් කම්බ්ලි ග්‍රැහැම් ස්මිත් රිකී පොන්ටිං මේ දස්කම දැක්වූ නෙක් ක්‍රිඩකයන් පස්දෙනා ය. ශ්‍රී ලංකා පිලේ කිසිදු ක්‍රීඩකයෙකු මෙයට පෙර මේ දස්කම දක්වා නැත.

මෙම ද්විත්ව ශතකය ඔහු ලද 6 වන ද්විත්ව ශතකය වන අතර ඒ අනුව වැඩිම ද්විත්ව ශතක ලාභීන් අතර ඔහු ලෝකයේ 4 වන ස්ථානයට පත්විය.

## තරු පෙන්විය හැකි තුරුණු වියේදී සැඟවෙන ටෙනිස් තාරකාව



**ක්‍රීඩාව** කුමක් වුවත් ඒ ඒ ක්‍රීඩාවන් හි නියැලෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උපරිම කුසලතා මතුවන්නේ අවුරුදු 20 ත් 30 ත් අතර වයසේදීය. මේ නිසා කිසියම් ක්‍රීඩාවක් ඔස්සේ ලෝකය ජයගත් බොහෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ සමුගැනීම් බොහෝවිට අපට අසන්නට ලැබෙන්නේ ඔවුන් 35 වැනි විය පසු කරමින් සිටින අවස්ථාවලදීය. මේ නිසා එම වයස් සීමාවන් හී පසුවන සුපිරි ක්‍රීඩකයකු වුවද සිය සමුගැනීම ප්‍රකාශයට පත් කළහොත් එය කිසිවකුත් පුදුමයට පත් කරවන්නක් නොවිය හැකි ය.

එහෙත් 24 හැවිරිදි වියේදී කිසිවකු හෝ ක්‍රීඩාපිටිය හැර යන්නේද, ඔහු හෝ ඇය ක්‍රීඩාවෙන් ලෝකයම ජයගෙන ඇත්තෙකු නම් එවන් සමුගැනීමකින් ක්‍රීඩාලෝලීන් පුදුමයට පත් නොවන්නේ නම් පුදුමයකි. නමුත් බෙල්ජියම ලොවට දායාද කළ සුපිරි ටෙනිස් ක්‍රීඩිකාවක වන කිම් ක්ලයිස්ටර්ස් 2007 වසර අවසා-නයත් සමග ටෙනිස් පිටියෙන් සමුගන්නා බව පසුගියදා ප්‍රකාශ කළාය.

මේ වනවිට ටෙනිස් ක්‍රීඩිකාවන් අතර 5 වැන්නිය ලෙසට ශ්‍රේණි ගතව සිටින කිම් උපත ලබා ඇත්තේ 1983 ජුනි 8 වැන-දාය. සිය ජීවිතයේ 24 වැනි වසර සම්පූර්ණ වෙද්දී ක්‍රීඩා පිටිය හැර යන්නට තීරණය කර ඇති ඇය කලක් ලොව අංක එකේ ටෙනිස් ක්‍රීඩිකාව ලෙසද ශ්‍රේණි ගතව සිටියාය.

බෙල්ජියම නියෝජනය කළ ප්‍රබල පාපන්දු ක්‍රීඩකයෙකු වූ ලී ක්ලයිප්ස්ටර්ස් ඇගේ පියාය.. එල්ස් වැන්ඩ කැට්බීක් නම් වූ ඇගේ මව එරට සිටි අති දක්ෂ ජිම්නාස්ටික් ක්‍රීඩිකාවකි. ඇගේ එකම සොහොයුරිය එල්කෙ ද කලක් ටෙනිස් ක්‍රීඩාවේ නියැලී ඇතත් ආබාධ නිසා 2004 වසරේ ක්‍රීඩාවෙන් සමුගෙන තිබුණි. කිම් පාපන්දු ක්‍රීඩක තම පියාගේ දෙපාවල ශක්තිය ක්‍රියාකාරීත්වයද ජිම්නාස්ටික් ක්‍රීඩිකා මවගේ සිරුරේ නම්‍යශිලී භාවයද කදිමට උකහා ගනිමින් සුපිරි ටෙනිස් ක්‍රීඩිකාවක් වීමට තරම් වාසනාව-න්ත වුවාය.

ඇය දිනා ඇත්තේ ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතා එකකි. ඒ එකම ශූරතාව කිම්ට හිමිවූයේ 2005 වසරේ පැවැති ඇමරිකානු විවෘත ටෙනිස් තරගාවලියේදීය. ඒ හැර ඇය ග්‍රෑන්ඩ් ස්ලෑට් ටෙනිස් තරගමාලා 4 කම අවසන් තරගය දක්වා පැමිණීමටද සමත්ව සිටියාය.

වෘත්තීය ටෙනිස් ක්‍රීඩිකාවක බවට කිම් පත්වූයේ 1999 වසරේදීය. එවකට 16 හැවිරිදි ක්‍රීඩිකාවක ලෙස විම්බල්ඩන් ටෙනිස් තරගාවලියට පිවිස එහි සිව්වැනි වටය තෙක් පැමිණීමටද ඇය සමත් වූවාය. සිව්වැනි වටයේදී ටෙනිස් පිටියේ ඇගේ වීරවරිය වූ ස්ටෙෆි ග්‍රාත් හමුවේ කිම් පරාජය වී තිබුණි.

කිම් ක්ලයිජස්ටර්ස් ටෙනිස් ක්‍රීඩිකාවක ලෙස වඩාත්ම කැපී පෙනුනේ 2003 වසරේදීය. එම වසරේ ඈ විම්බල්ඩන් හා ප්‍රංශ විවෘත යන ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් තරගමාලා දෙකේම කාන්තා යුගල ශූරතා දිනා ගත්තාය. එසේම ප්‍රංශ විවෘත හා ඇමරිකානු විවෘත ටෙනිස් තරගාවලියන් හි කාන්තා කේවල ඉසව්වේ අවසන් තරගයට සහභාගිවීමේ අවස්ථාවන්ද ඇයට හිමිවිණි. නමුත් ඒ අවස්ථා දෙකේම තවත් සුපිරි බෙල්ජියම් ක්‍රීඩිකාවක වූ ජස්ටින් හෙනින් හමුවේ කිව් පරාජයට පත්ව ඇත.

ඕස්ට්‍රේලියානු ටෙනිස් ක්‍රීඩකයෙකු වූ ලේටන් හෙවිට් සමග 2004 වසරේදී පෙමින් බැඳුණු ඇගේ ඒ ප්‍රේම කතාවට ආයුෂ තිබුණෝ වසරක තරම් කෙටි කාලයකි. 2005 වසරේ දෙදෙනාගේම එකඟතාව මත ඔවුන්ගේ වෙන්වීම සිදුවිණ.

එසේම 2004 යලිත් ඕස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලිය කාන්තා කේවල අවසන් තරගයට හිමි සුදුසුකම් ලබාගත් නමුත් එවරද ඇය පරා-ජයට පත්වුනේ ජස්ටින් හෙනින් හමුවේය. අනතුරුව දකුණු අතේ මැණික් කටුවේ ආබාධයකට ගොදුරු වූ කිම් පසුව ඒ සඳහා සැත්කමකටද මුහුණ දුන්නාය.

කාලය කෙමෙන් ගෙවී ගොස් 2005 වසර උදාවිනි. තම පළමු වන ග්‍රෑන්ඩ් ස්ලෑම් කේවල ටෙනිස් ශූරතාව ලෙස ඇමරිකානු විවෘත ටෙනිස් කිරුළ කිම් දිනා ගත්තේ එම වසරේදීය. එහෙත් ඒ ජයග්‍රහණයත් සමගම ඇය එතෙක් ඇගේ පුහුණුකරු ලෙස කටයුතු කළ මාක් ඩි හුස් ගෙන් ද වෙන්විනි.

ගෙවී ගිය 2006 වසර කිම් ක්ලයිජ්ස්ටස් ටෙනිස් ක්‍රීඩිකාවක ලෙස එතරම් හිතකර වසරක් වූයේ නැත. ඕස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලියට පෙර සිඩ්නි හි පැවැත්වෙන ටෙනිස් තරගාවලියේ අවසන් පූර්ව වටයේ තරගයකදී සිය ඉන ප්‍රදේශයේ වම් පැත්තේ ඇතිවූ ආබාධයක් නිසා ඇයට තරගාවලියෙන් ඉවත්වීමට සිදුවී තිබුණි.

ඉන්අනතුරුව පැවැති ඕස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලියේදී ප්‍රංශයේ එමලි ටොරෙන්ටෝ සමග අවසන් පූර්ව තරගයට සහභාගි වී සිටියදී මතුවූ වළලු කර ආබාධයක් නිසාද තරගාවලිය අතහැර දමන්නට කිම්ට සිදුවුවාය. එම වසරේ නැවතත් ප්‍රංශ විවෘත ටෙනිස් තරගාවලියේද අවසන් තරගය දක්වා පැමිණෙන්නට කිම්ට හැකියාව ලැබුණි. එහෙත් එහි අවසන් තරගයේදී යලිත් ඇයට මුණ ගැසී තිබුනේ ඇගේ සම්ප්‍රදායික ප්‍රතිවාදී ක්‍රීඩිකාව වූ ජස්ටින් හෙනින් ය. සම්ප්‍රදායටම අනුව එවරත් කිම්ට සිදුවූයේ පරාජය බාර ගන්නටය.

කෙසේ වුවත් එය පරාජයේ එක්තරා විශේෂත්වයක් තිබුණි. ඒ එදින ඇගේ 23 වැනි උපන්දිනයද යෙදී තිබීමය. අනතුරුව පැවති විම්බල්ඩන් ටෙනිස් තරගාවලියේදී අවසන් පූර්ව වටයේදී කිම්ගේ ගමන නවතා දමන්නට ඉදිරිපත්ව තිබීම තවත් විශේෂත්වයක් විය. යළි මතුවූ මැණික් කටුවේ ආබාධය නිසා ඇයට එම වසරේ ඇමරිකානු විවෘත ටෙනිස් තරගාවලිය අහිමි වී ගියාය. එකී කණගාටුදායක සිදුවීම් සියල්ල මධ්‍යයේ වුවද එම වසරේ ඇයට සතුටු විය හැකි අත්දැකීමකට මුහුණදීමේ අවස්ථාවද හිමිව තිබුණි.

විසිහත් හැවිරිදි ඇමරිකානු ජාතික පැසිපන්දු ක්‍රීඩකයෙකු වූ බ්‍රයන් ලින්ච්ගේ පෙම්වතිය වීම ඒ අත්දැකීමය. කිම් ක්ලයිජ්ස්ටන් හිමිකම් කියන්නේ කාන්තා කේවල එකම එක ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් කිරුළකට පමණක් වුවත් ඇය සතුව ඉතා අගනා ලෝක වාර්තාවක් ඇත. ඒ ටෙනිස් ක්‍රීඩිකාවන්ගේ ශ්‍රේණි සටහනේ පළමු ක්‍රීඩිකාවන් සියදෙනා අතර නොසිට වසරක් ඇතුළත ලෝකයේ පළමු ක්‍රීඩිකාවවීමට සමත් වූ එකම ක්‍රීඩිකාව ලෙසිනි. ඇත්ත වශයෙන්ම එම වාර්තාවට හිමිකම් කියන්නට සමත් වූ ක්‍රිඩකයෙකු වුවද ටෙනිස් ඉතිහාසයේ නැති බැවින් ලිංග බේදයකින් තොරවම ඇය එහි හිමිකාරිය වී ඇත.

මේ අනුව කිම් 2003 වසරේ පළමු වරට අංක එකේ ක්‍රීඩිකාව බවට දෙසැම්බර් මාසයේ පත්ව ඇත්තේ ඊට වසරකට පෙර ශ්‍රේණි සටහනේ 134 වැනි ස්ථානයේ සිට ඉදිරියට ඇදෙමිනි.

කෙසේ වුවත් කිම් ක්ලයිජ්ස්ටස් සිය ටෙනිස් චාරිකාව මේ වසරේ නිමාවට පත් කිරීමට ස්ථිර-වම තීරණය කර අවසන්ය. අලුත් ජීවිතයක නැවුම් බලාපොරොත්තු දැන් ඇගේ ජීවිතයට එකතු වී ඇත.

### ශ්‍රී ලංකා බංග්ලාදේශ සංචාරය
### ඉදිරි තරග

Fri 20 1st ODI - Sri Lanka v Bangladesh
P.Saravanamuttu Stadium, Colombo

Sun 22 2nd ODI - Sri Lanka v Bangladesh
R.Premadasa Stadium, Khettarama, Colombo

Tue 24 3rd ODI - Sri Lanka v Bangladesh
R.Premadasa Stadium, Khettarama, Colombo

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila